# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2165/13 - 2020 මාර්තු මස 03 වැනි අඟහරුවාදා - 2020.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සේවා ව්‍යවස්ථාව

3 වන සංශෝධනය

2019 දෙසැම්බර් 09 දිනැති, අංක 2153/6 හා 2019 සැප්තැම්බර් 19 දිනැති, අංක 2141/73 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත 2015 ජුලි 28 දිනැති හා අංක 1925/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ ඡේද අංක 7.3.2.3.1, 7.3.2.5 (ii) සහ 7.3.2.5.(iii) යටතේ සඳහන් කරුණු ඉවත්කර, ඒ වෙනුවට පහත වගුව යටතේ දැක්වෙන කරුණු ඇතුලත් කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි

එම්.ඒ.බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020 පෙබරවාරි මස 28 වැනි දින.

| *ඡේද අංකය* | *යෝජිත සංශෝධනය* |
|---|---|
| 7.3.2.3.1 | අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට හෝ ඊට පෙර ඉහත 7.3.2 හි සඳහන් සුදුසුකම් සහිත රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයට අයත්, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ ශ්‍රී ලංකා ගුරු සේවයේ හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ පරිවේණාචාර්යවරයෙකු ලෙස හෝ පත්වීම ස්ථිර කරන ලද වසර පහ (05)කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයකු වීම. |
| 7.3.2.5 (ii) | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා ගුරු සේවයේ හෝ පරිවේණාචාර්යවරයෙකු ලෙස හෝ තනතුරේ ස්ථිර කර ඇති නිලධරයෙකු විය යුතුය. |
| 7.3.2.5.(iii) | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හෝ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හෝ රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට අයත් ශ්‍රී ලංකා ගුරු සේවයේ හෝ පරිවේණාචාර්යවරයෙකු ලෙස හෝ පූර්වාසන්න පස් අවුරුදු කාලය තුල සියලු වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබිය යුතු අතර එම කාලය තුළ විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතුය. |

03 - 718


1A - G 32136— 20 (2020/03)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*